## මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විශේෂ ශ්‍රේණියේ (MT – 08 - 2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් හඳුන්වා දී ඇති නව වැටුප් ප්‍රතිපත්තියට අනුකූලව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා ගණයෙහි (MT – 08 - 2016) විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර සඳහා මෙම පරිපාටිය සකස් කරනු ලැබේ. මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ දිනයේ සිට මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වේ.

**01. සම්බන්ධ වන ආයතන**

| | |
|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව | : මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>යොමු අංකය : CPC/PDHS/P01/04/2017<br>දිනය : 2017.06.16 |
| 1.2. අමාත්‍යාංශය | : මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය , දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය<br>යොමු අංකය: CPC/MH/1/20/1/29<br>දිනය.: 2017.07.06 |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | : යොමු අංකය: DMS/D/පොදු/11-2<br>දිනය: 2012.12.19 |
| 1.4 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය | : යොමු අංකය: CPC/CS/2/3/SM/(H(V)<br>දිනය: 2017.07.24 |
| 1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | : යොමු අංකය NCC/10/71/3/SR<br>දිනය: 2018.04.10 |
| 1.6. මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | : යොමු අංකය: CPC/PSC/24/22/2018<br>දිනය: 2018.08.21 |

**02.පත් කිරීම් බලධරයා** : මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

**03.සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : අතුරු වෛද්‍ය සේවාව
3.2. ශ්‍රේණි : මහජන සෞඛ්‍ය පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය)
3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

අතුරු වෛද්‍ය සේවා ගණයට අයත් මහජන සෞඛ්‍යට අදාළ රෝග නිවාරණය ප්‍රධාන අරමුණ කරගත් පරිසර සෞඛ්‍ය කළමනාකරණය, බෝවන හා බෝ නොවන රෝග පාලනය, ආහාර සෞඛ්‍ය, ජල සනීපාරක්ෂාව, අපද්‍රව්‍ය කළමනාකරණය, වාහක පාලනය, ගොඩනැගිලි හා ඉදිකිරීම් කළමනාකරණය, ආපදා කළමනාකරණය, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යයන් අධීක්ෂණය හා සියළුම විෂයන්ට අදාළ මහජන සෞඛ්‍ය අණ පනත් බලාත්මක කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

3.4. කාර්යයන් පැවරීම :

"තනතුර පදනම්ව කාර්යයන් පැවරීමක් සිදු කරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම අධීක්ෂණ කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක"

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

**සටහන -** විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

**05. වැටුප්**

5.1. සේවා ගණයට අදාළ වැටුප් කේතය : MT-8-2016

5.2. වැටුප් පරිමාණය : රු. 50200 -10 x 1345 –08 x 1630 – 76690

5.3. සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | අදාළ ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | 02 | 51545/= |

5.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

**06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු**

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක | 03 | විශේෂ ශ්‍රේණිය | • මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණ කටයුතු.<br>• මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ කාර්ය සාධන ඇගයීම.<br>• මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම<br>• මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සහාය වීම.<br>• පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට අදාළ උපදෙස් හා තොරතුරු ලබා දීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

❖ විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක - 03

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2. විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4. කුසලතා මත බඳවා ගැනීම

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

**සටහන :** මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි 7 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

7.4.2. සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.3. පළපුරුද්ද :

අදාළ තනතුරෙහි අධි ශ්‍රේණියේ / I වැනි ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ වසර පහ (05) ක සේවා කාලයක් සහිත අධි ශ්‍රේණියේ සිටින නිලධාරියෙකු වීම.

| තනතුර | අදාළ විශේෂ ශ්‍රේණියේ තනතුර |
|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක I ශ්‍රේණිය | විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක |

7.4.2.4. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

7.4.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතු ය.
V. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතු ය.
VI. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.4.3. වයස : අදාළ නොවේ

7.4.4. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට අදාළව

පවතින තනතුරු පුරප්පාඩු අනුව මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා එම අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහළම ලකුණු ලැබුවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු අනුව මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලැබේ. අධි ශ්‍රේණියේ / I ශ්‍රේණියේ අදාළ තනතුරු දරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සටහන : ඉහත ක්‍රමවේදය අනුව මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් උසස් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීමේදී යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගනු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන්ගේ කැමැත්තේ අනුපිළිවෙලට මනාපය ලකුණු කිරීමට අවස්ථාව ලබාදී බඳවා ගනු ලැබේ.

7.4.4.1 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

7.4.4.3.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය:
මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.25 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

7.4.4.3.2 <u>ලකුණු දීමේ පරිපාටිය</u>

(අ). විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට අදාළව

| ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍රය | ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. සේවා පළපුරුද්ද | 60 | අදාළ නොවේ |
| 02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 03. විශේෂ කුසලතාවයන් | 10 | |
| එකතුව | 100 | |

ඉහත (අ) හි සඳහන් ලකුණු පරිපාටිවලට අදාළව සවිස්තරාත්මකව ලකුණු පරිපාටි අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේදී මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබේ.

08. **කාර්යක්ෂමතා කඩඉම්** : අදාළ නොවේ

09. **භාෂා ප්‍රවීණතාව** : අදාළ නොවේ

10. **ශ්‍රේණි උසස් කිරීම්** : අදාළ නොවේ

11. **අර්ථ නිරූපණ :**

i. "ආණ්ඩුකාරතුමා" යන්නෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අදහස් වේ.

ii. "කොමිෂන් සභාව" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් වේ.

iii. "පත්වීම් බලධරයා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

iv. "අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

v. "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

vi. "බඳවා ගැනීම් පරිපාටිය" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණයේ විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක (MT – 8 – 2016) සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අදහස් වේ.

vii. "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දාවූ කාලසීමාවක් වන්නේය.

viii. "සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018.09.25 ........ දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

12. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය (බඳවා ගැනීමේ පරිපාටිය) ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුවූවන් සඳහා

"මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් ලබාදී ඇති MT-8-2016 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය."

12.1 (අ) නියමිත දින වන විට සේවයේ නියුතු මහජන සෞඛ්‍ය පරීක්ෂක විශේෂ ශ්‍රේණියට අයත් නිලධාරීන් ප්‍රතිසංවිධාන අතුරු වෛද්‍ය සේවාවේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සිදු කරනු ලැබේ.

(ආ) මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල සිටින නිලධාරීන් අතුරු වෛද්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට අන්තර්ග්‍රහණය හේතුකොටගෙන නියමිත දිනදී අදාළ පන්තිවල / ශ්‍රේණිවල ඒ ඒ නිලධාරීන්ට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් සිදු නොවනු ඇත.

13. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය / මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා රෙගුලාසි අදාළ වේ.

14. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටළුවකදී මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

15. අන්තර්කාලීන විධිවිධාන

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දින සිට ඉදිරියට වසර 03 ක් දක්වා අන්තර්කාලීන විධිවිධාන ක්‍රියාත්මක වන අතර එම කාලය තුළ විශේෂ ශ්‍රේණියට / විශේෂ ශ්‍රේණියේ තනතුරු වලට උසස් කිරීම පහත සඳහන් ක්‍රමවේදයට අනුව සිදු කරනු ඇත.

ලකුණු ලබා දීමේ ක්‍රමය

ජ්‍යෙෂ්ඨත්වය - 60

මූලික සුදුසුකම ඉක්මවූ අධි ශ්‍රේණිය / I වන ශ්‍රේණියේ සෑම එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 05 බැගින් හිමි වේ.

කුසලතාවය - 40

ඇගයීම් කරනු ලබන දිනට ආසන්නතම,

| | |
|---|---|
| අඛණ්ඩ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 40 |
| වසර 04ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 32 |
| වසර 03ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 24 |
| වසර 02ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 16 |
| වසර 01ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - ලකුණු 08 |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2018. 09. 25 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ........................ |
| 02. ජී.පී.එස්.ඒ. දිසානායක මහත්මිය | (සාමාජික) | ........................ |
| 03. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................ |
| 04. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ........................ |
| 05. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | ........................ |

දිනය: 2018.08.21

ආණ්ඩුකාර ලේකම්,

2018.08.21 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 18/996 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණයෙහි (MT – 8 - 2016) විශේෂ ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය, 08/09/2018

........................................
එල්.ඒ. සුජාතා විජේසිංහ,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

එල් ඒ. සුජාතා විජේසිංහ
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව

අනුමත කරමි / ~~නොකරමි.~~

..................................................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා

දිනය: ........................

අනුමත කරමි / නොකරමි

..................................
පී. බී. දිසානායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2018/09/28